වෙරිටේ විදසුන්

සැප්තැම්බර් 2021

09 වැනි වෙළුම
05 වැනි කාණ්ඩය

VERITÉ RESEARCH
Strategic Analysis for Asia

වෙරිටේ රිසර්ච් යනු, ආර්ථික විද්‍යාව, නීතිය, දේශපාලනය සහ ජනමාධ්‍යය විෂයෙහි ඉහළ මට්ටමේ තීරකවරුන් සඳහා උපායමාර්ගික විශ්ලේෂණ සපයා දෙන, කොළඹ පිහිටි, ස්වාධීන බුද්ධි පර්ෂදයකි.

**සුභාෂිණී අබේසිංහ**
**පුමුදිකා අමරසේකර**
**රවීකා ප්‍රනාන්දු**
**අශ්වින් පෙරේරා**
*පර්යේෂක*

**නිශාන් ද මෙල්**
*විදසුන් මාලා සංස්කාරක*


Image courtesy of Unsplash

# ශ්‍රී ලංකාව කාබනික පොහොර වෙතට මාරු වීමට දැරූ ප්‍රයත්නය: ගොවීන්ගෙන් ආහාර හිඟයක් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමක්

**සියයට 64**

රසායනික පොහොර සහ රසායනික පළිබෝධනාශක හා වල්නාශක බැහැර කිරීමේ ප්‍රතිපත්තියට සහය දැක්විය

**සියයට 78**

සංක්‍රමණය සඳහා වසරකට වැඩි කාලයක් ඉල්ලා සිටින ලදි

**සියයට 85**

දැනට පවතින පොහොර සීමා කිරීම් යටතේ මීළඟ අස්වැන්නේ අඩුවීමක් අපේක්ෂා කරන ලදි

ශ්‍රී ලංකාව 2021 අප්‍රේල් මස සිට රසායනික පොහොර ආනයනය තහනම් කරමින්, කාබනික පොහොර වෙත මාරු වීමට පියවර ගන්නා ලදී. පවතින රසායනික පොහොර තොග අඩු වෙමින් පවතින වාතාවරණයක් තුල පොහොර ප්‍රතිපත්තිය පිළිබඳව ගොවීන්ගේ අදහස් සහ එහි බලපෑම අවබෝධකර ගැනීම සඳහා වෙරිටේ පර්යේෂණ ආයතනය ජූලි මාසයේදී සමීක්ෂණයක් පවත්වන ලදී. ගොවීන් මෙම ප්‍රතිපත්තියට පුළුල් ලෙස සහයෝගය දැක්වූ නමුත් ගොවීන්ගේ අදහස වුයේ මෙම පරිවර්තනය සාර්ථකව කිරීමට අවශ්‍ය දැනුම හා කාලය නොමැතිකම නිසා බොහෝ අඩු අස්වැන්නක් ලැබෙනු ඇති බවයි.

2021 අප්‍රේල් 22 වැනි දින ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින්, ශ්‍රී ලංකාව "රසායනික පොහොරවලින් තොර ලොව පළමු රට"[1] බවට පත් කිරීමේ අරමුණින් රසායනික පොහොර ආනයනය කිරීම සම්බන්ධයෙන් තහනමක් ප්‍රකාශයට පත් කළේය. 2021 මැයි 6 වැනි දින මුදල් අමාත්‍යාංශය විසින් පළකරන ලද ගැසට් පත්‍රයක් මගින් මෙම තීරණය නීතියක් බවට පත් විය.[2]

ගොවීන්ගේ අදහස් සහ මෙම තීරණයේ බලපෑම සොයා බැලීම සඳහා 2021 ජූලි 1 සිට 10 දක්වා කාලය තුළ වෙරිටේ රිසර්ච් විසින් ගොවීන් අතර දීපව්‍යාප්තදුරකථන සමීක්ෂණයක් පවත්වන ලදී. මෙම සමීක්ෂණය තුළින් පළාත් නවයම ආවරණය වූ අතර සියලුම ප්‍රධාන භෝග වර්ග වගා කරන ගොවීන් 1,042 ක් ඊට ඇතුළත් විය. වී, පළතුරු, එළවලු, පොල්, තේ, සුළු අපනයන භෝග (කුළුබඩු) සහ ධාන්‍ය වර්ග එම භෝග වර්ග වේ.

1. සුල්ෆික් ෆර්සාන් 'Sri Lanka will become first country to be free of chemical fertiliser; President', නිව්ස් ෆර්ස්ට් 29 අප්‍රේල් 2021, at https://www.newsfirst.lk/2021/04/29/sri-lanka-will-become-first-country-to-be-free-of-chemical-fertilizer-president/ (අවසන් වරට ප්‍රවේශ වූයේ 12 දෙසැම්බර් 2021)

2. 2021 ජූලි 31 දින අංක 2238/45 දරන සංශෝධිත ගැසට් පත්‍රයක් මගින් පොහොර නිෂ්පාදනය කිරීමේ අරමුණින් වෙල්ට් ඛනිජ සහ ක්ෂුද්‍ර පෝෂක ආනයනය කිරීමේ රෙගුලාසි ලිහිල් කර ඇත.

රජයට තීරණ ගැනීම සඳහා වැදගත් වන ප්‍රධාන සොයාගැනීම් හතරක් මෙම සමීක්ෂණය තුළින් හඳුනා ගැනිණි. (1) කාබනික පොහොර වෙත සංක්‍රමණය වීමේ රජයේ ප්‍රතිපත්තියට ගොවීහු පුළුල් ලෙස සහයෝගය දැක්වූහ; කෙසේ වෙතත්, ඔවුන්: (2) වර්තමාන සීමාවන් යටතේ අස්වැන්නේ විශාල අඩුවීමක් අපේක්ෂා කල අතර, ඔවුනට (3) කාබනික ගොවිතැනට සංක්‍රමණය වීමට අවශ්‍ය ප්‍රමාණවත් දැනුමක් මෙන්ම දැනුම ලබා ගත හැකි මූලාශ්‍රද නොතිබුණි. එසේම ඔවුන් (4) සංක්‍රමණය වීමට වැඩි කාලයක් අවශ්‍ය බවද පැවසීය.

මෙම සොයා ගැනීම් පෙන්වා දෙන්නේ, ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සම්පාදකයින්, රජයේ කාබනික පොහොර ප්‍රතිපත්තියට සහය දක්වන ගොවීන්ගේ ප්‍රායෝගික අදහස් සලකා බලා, ප්‍රතිපත්ති හේතු කොට ගෙන කෘෂි නිෂ්පාදන හා ආහාර නිෂ්පාදනයේ හිඟයක් ඇති වීම වළක්වා ගැනීමට කටයුතු කළ යුතු බවයි. එසේ කිරීමට අපොහොසත් වීම වසංගතය නිසා මතුව ඇති පීඩාව තවත් උග්‍ර කිරීමට හේතු වනු ඇත.

## නව පොහොර ප්‍රතිපත්තියේ පසුබිම

රසායනික පොහොර මත භාවිතය, ගොවීන් අතර ඉහළ මට්ටමක පැවතිණි (සමීක්ෂණ ප්‍රතිචාර අනුව). සමීක්ෂණයට සහභාගි වූ ගොවීන්ගෙන් 90% කට වැඩි පිරිසක් රසායනික පොහොර භාවිතා කරති. ඔවුන්ගෙන් බහුතරයකගේ (76%) රසායනික පොහොර භාවිතය, ඔවුන්ගේ මුළු පොහොර භාවිතයෙන් අඩකට වඩා වැඩිය. රටේ ප්‍රධාන ආහාරය වන බත සපයන වී ගොවීහු, වැඩියෙන්ම රසායනික පොහොර භාවිතා කරන්නෝද (94%) වෙති.

## කාබනික පොහොර ප්‍රතිපත්තිය සඳහා පුළුල් සහයෝගය

සමීක්ෂණය සිදු කරන කාලය වන විට (එනම්, තහනම හඳුන්වා දී මාස දෙකකට පසුව) ගොවීන් අතර රජයේ ප්‍රතිපත්තිය සඳහා ඉහළ මට්ටමක සහයෝග යක් පැවතිණි. ශ්‍රී ලංකාව කාබනික කෘෂිකර්මාන්තයට සංක්‍රමණය විය යුතු බවට තුනෙන් දෙකකට ආසන්න සංඛ්‍යාවක් එකඟ වූහ: “ශ්‍රී ලංකාව 100% කාබනික කෘෂිකර්මාන්තයට සංක්‍රමණය විය යුතු බවට ඔබ එකඟද?” යන ප්‍රශ්නයට සමීක්ෂණයට සහභාගි වූගොවීන්ගෙන් 64% ක් “ඔව්” යනුවෙන් පිළිතුරු දුන්හ.

## ගොවීන්ගෙන් බහුතරයක් ඊළඟ අස්වැන්න අඩකට ආසන්න ප්‍රමාණයකින් අඩුවනු ඇතැයි අපේක්ෂා කළහ

මෙම සමීක්ෂණය සිදුකරන අවස්ථාවේදී මෙම තහනමත් සමග වෙළෙඳ පොළේ නිර්මාණය වූ රසායනික පොහොර හිඟය නිසා ගොවීන්ට අවශ්‍ය පොහොර ප්‍රමාණය ලබා ගත නොහැකි තත්ත්වයක් උදා වී තිබිණි. සාමාන්‍ය භාවිතයට සාපේක්ෂව වත්මන්/ඉතාම මෑතකාලීන වගා චක්‍රයේ භාවිතා කරන රසායනික පොහොර ප්‍රමාණය අඩු කිරීමට ඔවුනට සිදු විණිදැයි 2021 ජූලි මාසයේදී විමසූ විට සමීක්ෂණයට සහභාගි වූ ගොවීන්ගෙන් 63%ක් “ඔව්” යැයි පැවසූහ. සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් අඩකට ආසන්න (44%) සංඛ්‍යාවක් පැවසුවේ සමස්තයක් ලෙස රසායනික පොහොර සහ/හෝ රසායනික පළිබෝධනාශක සහ වල්නාශක භාවිතය මෑතකාලීනව අඩු කිරීමට සිදු වීම ඔවුන්ගේ වඩාත්ම මෑත අස්වැන්නට අහිතකර ලෙස බලපෑ බවයි.


රසායනික පොහොර හෝ කෘෂිරසායන ද්‍රව්‍ය භාවිතා කිරීමට නොහැකි වුවහොත් අස්වැන්න/ නිෂ්පාදනයේ ප්‍රමාණයට ඉදිරියේදී සිදු විය හැක බලපෑම ඔවුන් සිතන ආකාරයට කුමක් විය හැකිදැයි විමසූ විට, අතිබහුතරයක් (85%) පවසා සිටියේ ඉදිරියේදී තම අස්වැන්නේ අඩුවීමක් අපේක්ෂා කරන බවයි. සමීක්ෂණයට සහභාගි වූගොවීන්ගෙන් අඩක් අස්වැන්න 40%කට වඩා අඩු වනු ඇතැයි අපේක්ෂා කළහ (ප්‍රදර්ශිතය 1).

## දැනුම සහ මග පෙන්වීම නොමැතිකම


රසායනික පොහොරවලින් තොර කෘෂිකර්මාන්තය පිළිබඳව ගොවීන්ට අවශ්‍ය දැනුම හා මඟපෙන්වීම නොමැති බව සමීක්ෂණයෙන් අනාවරණය විය. ගොවීන්ගෙන් 35% ක් රසායනික පොහොර නොමැතිව වගා කිරීමට ප්‍රමාණවත් දැනුමක් ඇති බව විශ්වාස කළ අතර, එම කණ්ඩායමින් තවදුරටත් කරුණු විමසූවිට හෙළි වූයේ, තම භෝග සඳහා සුදුසු කාබනික විකල්පයන් පිළිබඳව දන්නා බව පැවසූපිරිස 23% ක් පමණක් බවත්, සුදුසු කාබනික පොහොර නිවැරදිව යොදන්නේ කෙසේදැයි දන්නා බව පැවසූ පිරිස 20% ක් පමණක් බවත්ය. (ප්‍රදර්ශන 2).

රසායනික පොහොර හෝ රසායනික පළිබෝධනාශක සහ වල්නාශක භාවිතා නොකර කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ/උපදෙස් ලැබී ඇත්දැයි විමසූ විට, ගොවීන්ගෙන් තුනෙන් දෙකකට ආසන්න (63%) සංඛ්‍යාවක් "නැත" යනුවෙන් පැවසීය. කිසිදු රසායනික පොහොරක් හෝ කෘෂි රසායනයක් භාවිතා නොකර වගා කරන්නේ කෙසේද යන්න පිළිබඳව උපදෙස්

**ප්‍රදර්ශිතය 1 - වර්තමානයේදී සහ ඉදිරියේදී අස්වැන්නේ සිදු විය හැකිඅඩු වීම**



ප්‍රදර්ශිතය 2 - කාබනික ගොවිතැන පිළිබඳ දැනුම සඳහා ඇති ප්‍රවේශය




දිය හැකි දැනුමක් හා පළපුරුද්දක් ඇති පුද්ගලයින් හඳුනන්නේ දැයි විමසූ විට ගොවීන්ගෙන් අඩකට වඩා "නැත යනුවෙන් පැවසූහ.

## ගොවීන්ට කාබනික ගොවිතැනට මාරු වීම සඳහා වැඩි කාලයක් සහ රජයේ උපකාර අවශ්‍ය වේ

ශ්‍රී ලංකාව 100% කාබනික කෘෂිකර්මාන්තයට සංක්‍රමණය විය යුතු බවට ගොවීන්ගෙන් තුනෙන් දෙකක් පමණ එකඟ වූහ. කෙසේ වෙතත්, 100% කාබනික කෘෂිකර්මාන්තයට සාර්ථකව සංක්‍රමණය වීමට කොපමණ කාලයක් අවශ්‍යදැයි විමසූ විට, ප්‍රතිපත්තියට සහය දුන් අයගෙන් 78% ක් පවසා සිටියේ සංක්‍රමණය වීමට වසරකට වඩා වැඩි කාලයක් අවශ්‍ය බවයි.

"කාබනික කෘෂිකර්මාන්තයට සාර්ථකව සංක්‍රමණය වීම සම්බන්ධයෙන් ඔබ රජයට ලබා දෙන උපදෙස්/යෝජනා මොනවාද?" යන ප්‍රශ්නයට ලැබුණු ප්‍රතිචාර අතරින් පහත සඳහන් ඉල්ලීම් තුන ප්‍රමුඛ විය. 1) සංක්‍රමණය සිදු කිරීමට වැඩි කාලයක් ලබා දීම, 2) අවශ්‍ය මාර්ගෝපදේශ/උපදෙස් ලබා දීම, සහ 3) ප්‍රමිතියක් සහිත කාබනික විකල්ප ලබා දීම.

## නිගමනය

මෙම සමීක්ෂණයට සහභාගී වූ ගොවීන්ගෙන් බහුතරයක් ඉල්ලා සිටිනුයේ ප්‍රතිපත්තිය වෙනස් කරන ලෙස නොව ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවන ආකාරය සඳහා  වඩාත් ප්‍රායෝගික ප්‍රවේශයක් අනුගමනය කරන ලෙසය.

මෙම සමීක්ෂණයේ සොයාගැනීම්, මතු වීමට ඉඩකඩ ඇති ආහාර හිඟයක් පිළිබඳව ගොවීන් විසින් රජයට සිදු කරන ලද පූර්ව අනතුරු ඇඟවීමකි. මෙම පූර්ව අනතුරු ඇඟවීම් සහ කාබනික පොහොර භාවිතය වෙත සංක්‍රමණය වීමේ සැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා වැඩි කාලයක් සහ සහය ලබා දෙන ලෙස ගොවීන් විසින් සිදු කරන ලද ප්‍රායෝගික ඉල්ලීම් සැලකිල්ලට ගෙන කටයුතු කිරීම මගින්, ප්‍රතිපත්ති හේතු කොට ගෙන ඇති විය හැකි ආහාර හිඟයක් වළක්වා ගැනීමට ශ්‍රී ලංකා රජය පියවර ගැනීම වැදගත් වේ.◆

Copyright © 2023 Verité Research Pvt Ltd. All Rights Reserved. ISSN: 2386-1762.
Comments are welcome, email *publications@veriteresearch.org.*